**ඇලහැර ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඇලහැර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇලහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

*මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.774,950 ක වියදම උපචිත වියදම් යටතේ දක්වා නොතිබුණි. | පසුව ගැලපීම් කළ බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ උසාවි දඩ ආදායම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | බකමූණ සතිපොළ හා දියබෙදුම ඉගෙනුම් මධ්‍යස්ථානයට අදාළ කලින් ලද ආදායම රු.33,800 ක් සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාළ ආදාහනාගාර ආදායම් රු.10,000 ක් හා ඉදිරි වර්ෂයට අදාළ ශ්‍රවනාගාර කුලී ආදායම් රු.5,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි තොරතුරු ලබාදෙන ලෙසට උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වටිනාකම් හා උපයෝගී ලේඛන අනුව ගිණුම් විෂයයන් 04 කට අදාළ වටිනාකම් අතර රු.148,551 ක නොසැසඳීම් පැවතුණි. | ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරන බව | උපයෝගී ලේඛන සමඟ සැසඳීම් කර නිවැරදි අගයන් හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 03 කට අදාළ වටිනාකම් අතර රු.5,862,052 ක නොසැසඳීමක් පැවතුණි. | ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරන බව | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සැසඳිය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| කර්මාන්ත ණයගැතියෝ | 6,781,811 | ණයගැති/ ණයහිමි උපලේඛනය | ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කරන බව | අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| කර්මාන්ත ණයහිමියෝ | 8,278,872 | ශේෂ සනාථ කිරීම් | | |
| ලැබිය යුතු කසල ගාස්තු | 561,500 | යාවත්කාලීන කරන ලද කසල බදු ලේඛනය උපලේඛනය | යාවත්කාලීන ලේඛනය සකස් කරන බව | අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| කසල ගාස්තු ආදායම | 71,400 | | | |
| හිඟහිටි වැටුප් ප්‍රතිපූර්ණය | 214,200 | උපලේඛනය | ඉදිරිපත් කිරීමට අතපසු වී ඇති බව | අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| ලැබිය යුතු වාහන කුලී<br>ආදායම (පෙර හිඟ) | 1,052,242 | යාවත්කාලීන කරන ලද ආදායම් ලේඛනය උපලේඛනය | නිවැරදි කරන බව දන්වා ඇත. | අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| ක්ෂය වීම් | 76,838,937 | සමුච්චිත ක්ෂය උපලේඛනය<br>ස්ථාවර වත්කම් ලේඛනවල සමුච්චිත ක්ෂය ඇතුළත් කර නොතිබීම | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බව | අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| | ------------- | | | |
| | 93,798,962 | | | |
| | ======== | | | |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | රීති හා ප්‍රඥප්ති විධිවිධාන<br>---------------- | | | |
| | 2020 ජුලි 03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත් රීති අංක 61 | අත්තිකාරම් මුදල් නිදහස් කිරීම ඊට අදාළ ඇස්තමේන්තුවක් සකස් කරගනිමින් සිදුකළ යුතු වුවත්, 2023 වර්ෂය සඳහා අවස්ථා 95 ක් යටතේ රු.2,174,065 ක මුදලක් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමකින් තොරව ලබාදී තිබුණි. | මේ වන විට ඇස්තමේන්තු ඉදිරිපත් කරන බව | වවුචර්ය සමඟ ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>---------------- | | | |
| | මු.රෙ. 755 (1) හා (2) | භාණ්ඩ වල හා වෙනත් රජයේ දේපල වල භාරය පැවරී ඇති නිලධාරියෙකු සිය රාජකාරි අතහැරීමට පෙර ඔහු විසින් එම කාර්යය පවරනු ලැබ සිටින වෙන ඕනෑම නිලධාරියෙකුට තම වගකීම යටතේ ඇති සියලුම රජයේ භාණ්ඩ හා දේපල භාරදී, භාරදෙන ලද නිලධාරියාගෙන් ඒවා ලැබුණු බවට පිටපත් දෙකකින් යුක්ත කුවිතාන්සියක් ලබාගත යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. | දැනට භාණ්ඩ හා දේපල භාරව කටයුතු සිදු කරනු ලබන විෂය නිලධාරී වෙත භාණ්ඩ හා දේපල භාර දීමක් සිදු නොවූ බවත්, ගබඩාව භාර ගන්නා අවස්ථාවේදී තොග ගණනය කිරීමක් සිදු කර එය තහවුරු කිරීමකින් පසුව භාරගත් අතර මේ වන විට නියමිත ක්‍රමවේදයක් අනුව ගබඩා කාර්යයන් සිදු වන බව | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ අයභාරය රු.9,519,834 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.5,172,484 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,716,269 | 340674 | 263,740 | 1,133,993 | 1,781,498 | 803,982 | 511,575 | 1,057,059 |
| කුලී | 34,495,000 | 2,566,250 | 3,176,820 | 2,164,775 | 34,495,000 | 2,399,312 | 4,726,278 | 2,775,345 |
| බලපත්‍ර ගාස්තු | 885,000 | 1,716,790 | 752,590 | 1,430,220 | 745,250 | 1,470,140 | 1,228,610 | 466,020 |
| වෙනත් ආදායම් | 17,383,816 | 5,884,390 | 5,446,801 | 1,219,529 | 8,239,936 | 3,195,130 | 3,667,776 | 781,941 |
| | ------------- | ------------ | ----------- | -----*------ | ----------- | ------------ | ----------- | ----------- |
| එකතුව | 55,480,085 | 10,508,103 | 9,639,951 | 5,948,517 | 45,261,684 | 7,868,564 | 10,134,239 | 5,080,365 |
| | ======== | ======= | ======= | ====== | ======== | ======= | ======= | ======== |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු**<br>----------------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගත යුතු හිඟ වරිපනම් වටිනාකම රු.572,492 ක් වූ අතර, හිඟ ආදායම් සම්බන්ධව ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් ගාස්තු අයකර ගැනිමට කටයුතු කරන බව | නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී**<br>----- | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වාහන කුලී ආදායම රු.37,270,344 ක් වුවද, රැස්කර තිබූ ආදායම රු.3,176,822 ක් එනම් රැස්කළ යුතු ආදායමින් සියයට 08 ක ප්‍රතිශතයක් පමණක් වී තිබුණි. | හිඟ වාහන කුලී ආදායම් හේතුවෙන් රැස්කර ඇති කුලී ආදායම් අඩු වී ඇති බව දන්වා ඇත. | හිඟ වාහන කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ඇලහැර ප්‍රාදේශීය සභාවේ කඩ කාමර 35 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට රු.880,767 ක හිඟ ආදායමක් පවතින අතර, මෙම හිඟය මාස 05 සිට අවුරුදු 08 ක කාල පරාසයකට අදාළ වන අතර, හිඟ අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකරගත යුතුය. |

(ඇ) බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී අයකරගැනීම සඳහා කටයුතු නොකළ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම රු.139,000 ක් වී තිබුණි. | හිඟ අයකරගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ආදායම් යාවත්කාලීනව අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | **<u>ක්‍රියාකාරි සැලැස්ම</u>** | | |
| (i) | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් 08 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඉන් ක්‍රියාකාරකම් 02 ක් පමණක් ඉටුකර තිබුණි. | සභාවේ පවතින අරමුදල් ප්‍රමාණය අනුව මෙම වැඩසටහන් කර ඇති බව දන්වා ඇත. | කාර්යසාධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ මානව සම්පත් සංවර්ධනය සඳහා වැඩමුළු 15 ක් සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩමුළු 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | සභාවේ පවතින අරමුදල් ප්‍රමාණය අනුව මෙම වැඩසටහන් කර ඇති බව දන්වා ඇත. | කාර්යසාධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **<u>කතර්ව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>**<br>පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉකුත් වර්ෂයන් තුළදී කර්තව්‍යයන් 04 ක් ආරම්භ කර ඒ සඳහා රු.24,922,968 ක් වැයකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි. | ශිවිසුම් අමාත්‍යාංශය මඟින් අවලංගු කළ බව දන්වා ඇත. | කාර්යසාධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ඇලහැර ප්‍රාදේශීය සභාව විසින් රු.211,280 ක අධිභාර මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත | මෙම අධිභාර මුදල දායක මුදල් නොගෙවූ කාලය වෙනුවෙන් ගණනය | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවා තිබුණු අතර, මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කරන ලද අධිභාරයක් බව | |
| (ආ) | දියබෙදුම දෙහිවත්ත කඩකාමර වලට අදාළ ගිවිසුම් විගණනයට ඉදිරිපත් කිරීමට වගකිව යුතු නිලධාරීන් අපොහොසත් වූ අතර, මෙම කඩකාමර වලට අදාළ හිඟ ආදායම් රු.447,025 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | නියමිත පරිදි අදාළ කාර්යයන් සම්පූර්ණ කරන ලෙසට විෂය නිලධාරියාට දැනුම් දී ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට හා ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා 2022 පෙබරවාරි 18 දින ඉංජිනේරු වෙත ඉදිරිපත් කර ඇති අතර, තීරණ ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2023 නොවැම්බර් වන විටත් අදාළ අලුත්වැඩියාව සිදුකර නොතිබූ අතර, අලුත්වැඩියා වියදමද රු.880,000 සිට රු.1,408,100 දක්වා වැඩිවී තිබුණි. මේ හේතුවෙන් උපයාගත හැකි ආදායම්ද අහිමි වී තිබුණු අතර, යන්ත්‍රය සේවයේ යෙදවීමේ අවස්ථාවද අහිමි වී තිබුණි. | අළුත්වැඩියාව සඳහා වන අනුමැතිය ලබා ගැනීම ට යොමු කර ඇත. අනුමැතිය ලැබීමෙන් පසුව හැකි ඉක්මණින් මෙම අළුත්වැඩියා කටයුතු කරන බවට දන්වා ඇත. | අප්‍රමාදව අලුත්වැඩියා අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | ඇලහැර ප්‍රාදේශීය සභාව විසින් සභාවට අයත් භූමි වල සිදුකරන ලද අනවසර ඉදිකිරීම් කඩකාමර 02 ක් සඳහා 2015 දී ගිවිසුම් ඇති කරගෙන ඇති නමුත් ඊට අදාළ කුලී තක්සේරු කරගැනීමක්, ගිවිසුම් කාලය තීරණය කරගැනීමක් සිදුකර නොමැති අතර, මෙම කඩකාමර සඳහා කුලී අය නොවීම සම්බන්ධවද කටයුතු කර නොතිබුණි. | ගැටළුකාරී තත්ත්වය පිළිබඳ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා ඇති බව | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

-

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය විද්‍යුත් පුස්තකාල ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද පුස්තකාල ගොඩනැගිල්ලක වැඩ අවසන් කර ඇතත්, අවශ්‍ය මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් එම පුස්තකාල ගොඩනැගිල්ල නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. | ප්‍රමාණවත් සේවකයන් නොමැති අතර අභ්‍යන්තර කාර්යයන් වෙනුවෙන් යොදවා ඇති සේවකයන් වැඩි විෂය ප්‍රමාණයක් සමඟින් කාර්යයන් ඉතා අපහසුවෙන් සිදු කර ගෙන යනු ලබන දන්වා ඇත. | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 සිට 2017 දක්වා කාල සීමාව තුළ දුරගමන් සේවා බස් නැවතුම්පලක් හා වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතියකින් හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව කලු ගලක් කඩා ඉවත් කිරීම වෙනුවෙන් විධිමත් මූල්‍ය පටිපාටි අනුගමනය නොකර ගෙවූ රු.15,675,708 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණු අතර, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි. | මේ සම්බන්ධව මූලික විමර්ශනයක් පවතින බව දන්වා ඇත. | සභා අනුමැතියකින් තොරව කටයුතු කිරීම නිසා සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතු ඩබල් කැබ් රථයක් නිෂ්කාර්යව පැවතුණි. | කැබ් රථය පවරා ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බවත් දන්වා ඇත. | වාහනය අපහරණය සඳහා කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 252-6453 දරන කැබ් රථය 2022 ඔක්තෝබර් 12 දින සිට 2022 ඔක්තෝබර් 24 දින දක්වා සභාවේ සභාපති වරයා සමඟ අවස්ථා (දින) 07 කදී කි.මී. 1456 ක් ගමන් කර ඇති බව දක්වා තිබුණද, අදාළ ධාවන සටහන් පත්‍රයෙහි සභාපතිවරයා විසින් අත්සන් යොදා තහවුරු කර නොතිබුණි. | සභාපතිවරයාගේ නිල වාහනය අළුත්වැඩියා කරන කාලසීමාවේදී මෙම වාහනය පාවිච්චි කළ බව තහවුරු කළ හැකි බව දන්වා ඇත. | ධාවන සටහනෙහි අදාළ අත්සන් ලබාගත යුතුය. |
| (ආ) | 2010 මාර්තු 22 දින උතුරුමැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සභාව වෙත භාරදෙන ලද ට්‍රැක්ටර් රථ 02 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචි නොකරන ලද වාහන පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාළව ලිඛිතව ඉල්ලීම් යොමු කර ඇති බව දන්වා ඇත. | ලියාපදිංචි කරගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 20 ක් විධිමත් අයුරින් සම්පූර්ණ කිරීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි. | ත්‍රෛයිමාසික කාර්යය මණ්ඩල වාර්තා මඟින් මේ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව දන්වා ඇත. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවක ණය වටිනාකම රු.1,301, 181 කට අදාළ ණය ලිපිගොනු 13 ක් විගණනය වෙත ඉදිරිපත් නොවුණු අතර, ගෙවන ලද රු.719,584 ක මුදලකට අදාළව ණය ගිවිසුම (පොදු 272 ආකෘතිය) හා පොදු 158 ආකෘතිය සම්පූර්ණ කර නොතිබුණි. | මෙම ගොනු සියල්ල සති දෙකක් අතුළත සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙසට විෂය නිලධාරිනිය වෙත ලිඛිත ව දැනුම් දී ඇති බව දන්වා ඇත. | ලිපිගොනු ඉදිරිපත් නොකිරීම සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 4/2015 හි 1.3 ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර සෑම මාසයක් අවසානයේදීම මහ සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, අදාළ නිලධාරිවරයා වෙත වෙනත් රාජකාරිද පවරා තිබූ බැවින් ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සඳහා සුදුසු අයෙක් ආයතනය සතුව නොමැති බව දන්වා ඇත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| NCP/LG/ACC02/01 හා 2023 ජනවාරි 02 දින විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සෑම කාර්තුවකට වරක්ම පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු 01 ක් පමණක් පවත්වා තිබුණි. | 2024 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට යොමු කර ඇති කාල සටහන් අනුව විගණන සහ කළමණාකරණ කමිටු පැවැත්වීමට කටයුතු සලසා ඇති බව | නියමිත පරිදි විගණන කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. |

### 4.3 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (ආ) වගන්තිය යටතේ කාර්මාන්ත වල අපද්‍රව්‍ය මුදාහැරීම, තැන්පත් කිරීම හා වායු විමෝචනයන් හා කම්පනයන් හා ශබ්දයන් පිටකිරීම සඳහා අධිකාරිය ලබාදෙන අතර, මෙම බලපත්‍ර සෑම වර්ෂ 03 කට වරක් අලුත් කළ යුතු නමුත් 2023 වර්ෂයේ පාරිසරික බලපත්‍ර කල් ඉකුත් වූ බලපත්‍ර ලාභීන් 26 දෙනෙකු නැවත එම බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර අළුත් කිරීම සඳහා කටයුතු කරන බව. | පාරිසරික බලපත්‍ර සම්බන්ධ නියාමනය කළ යුතුය. |